මාධ්‍ය තුළ පළ වන ඇතැම් පුවත් වාර්තාවන්හි, එකම වරද සිදුකළ කාන්තාවන් සහ පිරිමින් නීතියට හසුවූ අවස්ථාවකදී, කාන්තාව පමණක් වඩාත් ඉස්මතු කොට දැක්වීමේ භාවිතාවක් දක්නට ලැබේ. එනම්, එහිදී කාන්තාව සහ පිරිමියා විසින් එකම වරද සිදුකරනු ලැබූ අවස්ථාවකදී වුවත්, කාන්තාව කළ වරදට වැඩි බරක් යොදා පෙන්වීමක් දක්නට ලැබේ. ඊට උදාහරණ ළෙස "මත් කුඩු ජාවාරම් කළ කාන්තාවක් ඇතුළු හයක් පොලිස් දැලේ", "කුඩු ලඟ තිබී කතක් එක්ක 6ක් දැලේ" වැනි සිරස්තල දැක්විය හැක.

මෙම පුවත් වාර්තාවන් තුළ කාන්තාව පමණක් ඉස්මතු කෙරී ඇති අතර, එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් බවත් මෙසේ දක්වමු. මෙසේ සිය වාර්තාකරණය තුළ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීම් නොකිරීම මාධ්‍ය සතු ආචාර ධාර්මික වගකීමක් බවද සඳහන් කරමු.

**#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina**